# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ**
**පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය**

# ඇබෑර්තු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර - MM1-1 (තනතුරු 01)

**රැකියා විස්තරය :**

මානව සම්පත් සැලසුම් කිරීම, සේවකයින් බඳවාගැනීම් හා තෝරා ගැනීම්, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය අධීක්ෂණය කිරීම, මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සහායවීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ විනය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, සහකාර අධ්‍යක්ෂ මට්ටමට අඩු පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කිරීම, කාර්යාලයීය ප්‍රවාහන කටයුතු පරිපාලනය කිරීම, මුද්‍රණ කටයුතු, ගබඩාව හා ඉන්වෙන්ට්‍රිවල නිරතවීම, පැමිණීම, නිවාඩු සහ ආයතනික කරුණු අධීක්ෂණය කිරීම හා උපදේශනය, අදාළ රජයේ චක්‍රලේඛන සමග යාවත්කාලීනව සිටීම, කාර්ය මණ්ඩල ස්ථාන මාරු යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, පුහුණු කිරීමේ අවශ්‍යතා විශ්ලේෂණය සහ පුහුණු සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම් සංවර්ධනය, සේවක වරප්‍රසාද ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, සේවා සපයන්නන්ගේ සියලු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම, අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) විසින් පවරන වෙනත් රාජකාරීන්.

**සුදුසුකම්**

| | |
|---|---|
| **බාහිර :** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, පිරිස් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හා රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය සමග මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |
| **අභ්‍යන්තර :** | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| **වැටුප් පරිමාණය :** | MM 1-1-2016: රු.(53,175 - 10x1,375 - 15x1,910- 95,575) ක. සේ. දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි |
| **වයස :** | අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ. |
| **වෘත්තීය දීමනා :** | ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ. |

## 02. නීති සහ බලගැන්වීම් නිලධාරි තනතුර (II ශ්‍රේණිය) JM1-1 (තනතුරු 03)

| | |
|---|---|
| **රැකියා විස්තරය :** | පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම, පනතේ විධිවිධාන ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය සහය ලබාදීම, පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකරණයේ පවරා ඇති නඩු කටයුතු වලට අදාළව පැමිණිලි හා චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම, අධිකරණයේ නඩු ගොනු කිරීම සහ විභාග නඩු මෙහෙයවීම ඇතුළුව අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම, අවශ්‍ය විටෙක අනෙකුත් නියාමන ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම, අධිකාරියට එරෙහිව පවරා ඇති අධිකරණ නඩු කටයුතු මෙහෙයවීම සහ නීතිපති දෙපාර්තුමේනතුවේ නිලධාරීන් සහ අනෙකුත් නීති උපදේශකවරුන් සමග සම්බන්ධ වී කටයුතු කිරීම සහ අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) විසින් පවරනු ලබන වෙනත් රාජකාරී. |

**සුදුසුකම්**

| | |
|---|---|
| **බාහිර :** | ද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් LLB උපාධියක් තිබීම සහ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම. |
| **අභ්‍යන්තර :** | ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. |
| **වැටුප් පරිමාණය :** | JM 1-1-2016: රු. 42,600 - 10 x755 - 18x1,135 - 70,580). DMS චක්‍රලේඛ අංක 02/2016 අනුව |
| **වයස :** | අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ. |

**පොදු කොන්දේසි**

| | |
|---|---|
| **වෙනත් දීමනා :** | ඉහත වැටුපට අතිරේකව ජීවන වියදම් දීමනාව සහ වෙනත් අදාළ දීමනා ද අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ. |
| **පත්වීමේ ස්වභාවය :** | තනතුර ස්ථිර වන අතර, අදාළ රජයේ චක්‍රලේඛ වලට අනුව සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) සහ ප්‍රතිපාදන සඳහා හිමිකම් ලැබේ. |
| **බඳවා ගැනීමේ වැටුප :** | බාහිරව බඳවාගන්නා පුද්ගලයින් වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගන්නා පුද්ගලයන්ගේ වැටුප ආයතන සංග්‍රහය I, VII වන පරිච්ඡේදයේ විධිවිධාන/ප්‍රතිපාදන පරිදි තීරණය කරනු ඇත. |
| **සේවය ස්ථිර කිරීම :** | බාහිරව බඳවාගනු ලබන නිලධාරීන් වසර තුනක (3) පරිවාස කාලසීමාවකට පත් කරනු ලැබේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය සහ හැසිරීම සතුටුදායක නම් ඔහු/ ඇය තනතුරේ ස්ථිර කරනු ලැබේ. දැනටමත් තනතුරක ස්ථිර සේවයේ සිටින අභ්‍යන්තරව තෝරාගත් අපේක්ෂකයින් වසරක වැඩ බලන කාලයකට යටත් කරනු ලබනු ඇත. |

### බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය

බඳවා ගැනීමේ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සම්මුඛ පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ● අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| ● අදාළ අතිරේක සුදුසුකම් | - | ලකුණු 30 |
| ● අනෙකුත් කුසලතා | - | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | - | ලකුණු 25 |
| **එකතුව** | | ලකුණු 100 |

### වෙනත්

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
- තනතුරේ රාජකාරිය මැනවින් ඉටු කිරීමට කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයක් විය යුතුය.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත 2022-03-07 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් සනාථ කරන අදාළ සහතිකවල පිටපත් ද අයදුම්පත් සමග අමුණා තිබිය යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දිනට පසුව එවන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවර ආකාරයෙන් අනිසි බලපෑම් කිරීමට උත්සාහ දැරීම නුසුදුසුකමක් වනු ඇත. කරුණාකර අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ඔබගේ අයදුම්පත පහත ලිපිනයට යොමු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**2 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**